රත්මලාන/ මොරටුව සහ ජා ඇල / ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලං ර) හා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා නියෝජිතායතනය අතර 2006 මාර්තු 02 දින එළඹි නිශ්චිත ගිවිසුමේ (දායක අංකය 71001436) 11 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ නිශ්චිත ගිවිසුම අනුව, එවකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ මධ්‍යම පිරිසිදු කිරීමේ පිරියතයන්හි කර්මාන්ත හා ගෘහස්ථ ජලය පිළියම් කිරීම් නියමිත එකතුවක් සහිතව පරිසරයට හෝ ජනතාවට හානිකර නොවන ආකාරයකින් පිළියම් කර අප ජලය හා අපද්‍රව්‍ය අපහරණය කිරීම සමඟ රත්මලාන/ මොරටුව හා ජා ඇල / ඒකල යන ප්‍රදේශ දෙකෙහි පරිසර දූෂණය කළමනාකරණය කිරීම තහවුරු කර ගැනීමයි. ව්‍යාපෘතියේ දිගුකාලීන සමස්ත අරමුණ වන්නේ මහ කොළඹ ප්‍රදේශයේ ජනතාව සඳහා සෞඛ්‍ය හා ජීවන තත්ත්වයන්, පාරිසරික තත්ත්වයන්, අසංවේදී ජෛව පද්ධති වැඩි දියුණු කිරීම සඳහා දායක වීම සහ රත්මලාන / මොරටුව හා ජා ඇල / ඒකල ප්‍රදේශවල මලාපවහන ජාලයන් හා පිරිසිදු කිරීමේ පහසුකම් සැපයීම මගින් කොළඹ අවට කර්මාන්ත ප්‍රදේශවල තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමයි.

නිශ්චිත ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 16,300 කට සමාන එජඩො මිලියන 142.76 ක් වන අතර ඉන් රු.මිලියන 10,495 කට සමාන එජඩො මිලියන 91.92 ක් හෝ සියයට 64.4 ක ණයක් වශයෙන් හා රු.මිලියන 683 කට සමාන එජඩො මිලියන 5.98 ක් හෝ සියයට 4.2 ක ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබූ අතර ඉතිරිය රු.මිලියන 5,122 කට සමාන එ.ජ.ඩො මිලියන 44.86 හෝ සියයට 31.4 ක් මූල්‍යායනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2013 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2015 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර,මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව , සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

2013 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු වූ රු.4,175,369 ක මුදලක් ගිණුම්වලට ගෙන නොතිබුණි. ඊට අමතරව 2013 දෙසැම්බර් 31 දිනට උපදේශකයකුට ගෙවිය යුතු වූ රු.85,389,881 ක මුදලක්ද ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම්

-----------------------------------------------

පහත දක්වන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වගන්තියට අනුව රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. ටෙන්ඩර් ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත ගිවිසුම ලියාපදිංචි නොකරන ලද කොන්ත්‍රාත්කරුවන් සමඟ ගනුදෙනු නොකළ යුතුය. කෙසේ වෙතත් ඉහත අවශ්‍යතාවය සම්පූර්ණ නොකරන ලද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු සමඟ ව්‍යාපෘතිය ගනුදෙනු කර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. තවද, 2013 දෙසැම්බර් 31 දිනට වත්කම්වල පැවැත්ම තහවුරුකර ගැනීමට මුදල් රෙගුලාසි 756 අවශ්‍යතාවය පරිදි සමාලෝචිත වර්ෂයේදී භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

### 2.2.3 පසුගිය විගණනයේදී පෙන්වා දුන් නොවිසඳුණු විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------

පසුගිය වර්ෂයේ නිකුත් කළ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පහත සඳහන් විගණන නිරීක්ෂණ නොවිසඳී පැවතුණි.

(අ) රු.මිලියන 20.28 ක් පිරිවැය වූ පොම්පාගාරයක් (Pumping Station) ඉදිකිරීමට අත්පත් කරගත් ඉඩමක් සහ රු.මිලියන 28.23 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කළ මෝටර් රථ 7 ක් ව්‍යාපෘතිය විසින් 2012 දී අනුචිත පරිදි මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස පෙන්නුම් කර තිබුණි.

(ආ) නිශ්චිත ගිවිසුමේ 1 ව්‍යවස්ථාව අනුව ජාඇල/ ඒකල අපජලය පාලන පිළියම් කිරීමේ පිරියතට අදාළව පරිසරයට හෝ මහජනතාවට හානියක් නොවන අයුරින් පිළියම් කළ අප ජලය හා අපද්‍රව්‍ය අපහරණය කළ යුතුය. කෙසේ වුවද එවැනි ක්‍රමයක් 2015 අගෝස්තු 30 විගණන දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ .

| ප්‍රභවය | නිශ්චිත ගිවිසුම අනුව සැපයීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2013 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ණය | 91.92 | 10,495 | 600 | 8.92 | 1,137.47 | 84.55 | 9,686.14 |
| ප්‍රදාන | 5.98 | 683 | 100 | 0.90 | 115.95 | 6.22 | 740.06 |
| ශ්‍රී ලංකා රජය | 44.86 | 5,122 | 600 | 1.98 | 256.10 | 27.67 | 3,283.90 |
| | 142.76 | 16,300 | 1,300 | 11.80 | 1,509.52 | 118.44 | 13,710.10 |

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවලට අනුව ජාඇල/ ඒකල අපජල පාලන පිරියත සහ නල එළීම් ක්‍රියාකාරකම් 2013 දෙසැම්බර් 31 දිනට සැලකිය යුතු ලෙස සම්පූර්ණ කර තිබුණි. මොරටු රත්මලාන අපජල පාලන කිරීමේ පිරියත ඉදිකිරීම සහ නල එළීමේ ක්‍රියාකාරකම් සියයට 86.04 ක ප්‍රගතියක් 2013 දෙසැම්බර් 31 දිනට පෙන්වා තිබුණද අනෙකුත් රයිඩර් පයිප් ලේයින් (rider pipe laying) කුටීර (Manholes) ඉදිකිරීම සහ පීඩන පරීක්ෂා කිරීම වැනි උප ක්‍රියාකාරකම්වල සියයට 48.17 වැනි මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ව්‍යාපෘතිය යටතේ අපජලය පාලන පිරිපහදු පිරියත සහ නල එළීම් කටයුතු 2008 වර්ෂයේදී විදේශීය බද්ධ ව්‍යාපාරයක් වෙත පිරිනමා තිබුණු අතර 2013 වර්ෂයේදී බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන කොටස්කරුවකු බුන්වත්වීම හේතුවෙන් අදාළ කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කරන අවස්ථාවේදී සත්‍ය අලාභය තහවුරු කරගෙන නොතිබුණු අතර ව්‍යාපෘතිය විසින් කාර්යසාධන බැඳුම්කරය අය කරගෙන නොතිබුණි. ඉතිරි වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවත් රු.මිලියන 314.26 කට සමාන එජඩො මිලියන 2.38 ක පිරිවැයකට අනෙක් හවුල්කරු වෙත ප්‍රදානය කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

පරිවයක් ලෙස ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකර තිබූ අතර පොදුකාර්ය පිරිවැය සියයට 20 ක් ව්‍යාපෘතියෙන් අයකර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මෙසේ ගෙවන ලද පොදුකාර්ය වියදම රු.මිලියන 250.91 ක මුදලක් විය.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුවන්ට නියමිත දිනට ගනුදෙනු පියවීමට කටයුතු කර නොතිබුණි. එම නිසා ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 7.52 ක් ගෙවා තිබුණි.